# තන්ත්‍රයානිකයන්ගේ අධ්‍යාත්ම විද්‍යාව

පූජ්‍ය කහපොල සුගතරතන හිමි

Tantrayâna is a main branch of the Mahâyâna school. As a result of degeneration of classical Mahâyâna to a great extend gave rise to many schools such as Tantrayâna around the 3rd century A.D.Spiritualism is the main doctrine of the Tantrayâna.

They have used mantra #charm) Mudrâ #postures and gestures) Mandala #diagrams) etc. to present their doctrine. Through these means they tried to describe the essentials of Mahâyâna such as Sûnyatâ #voidness) vijñaptimâtrâtâ #mind only doctrine) Karunâ and Prajñâ #Compassion and wisdom).

මිනිස් සිත සහ සිරුර විනිවිද දැකීමට උත්සාහ කරන ආගමික සම්ප්‍රදායයකි තන්ත්‍රයානය. විවිධ අභිචාර ක්‍රම මගින් අධ්‍යාත්මික හඳුනාගැනීමට සිද්ධා උත්සාහ කරති. තවද කලෙක තාන්ත්‍රික ක්‍රම බුදු සමයට ඇතුළු වී දැයි පැවසීම අපහසුය. සිල්වන් ලෙවිගේ මතය අසංගගේ කාලයෙහි දී මෙය සිදු වූ බවයි.[1] ජී. ටුචි ද ඒ හා සමාන අදහසක් දරයි.[2] ඔහු තන්ත්‍රයානයේ ප්‍රභවය ක්‍රි. ව. 400 දී යයි නිගමනය කරයි. එය රජාපවිත්‍රයේ අසංගගේ ජීවන සමය මතයි. භට්ටාචාර්යගේ මතය අසංග ක්‍රි. ව. 03 වෙනි සියවසේදී විසූ බවයි.[3] අසංග ක්‍රි. ව. 04 වෙනි සියවසේදී විසූ බව වින්ටර්නිට්ස් ගේ අදහසයි.

අසංග පුරුෂ පුරයෙහි වර්තමාන පෙෂාවර්හි කෞශිකයකි බ්‍රාහ්මණ පවුලෙහි උපත ලැබීය. වසුබන්ධු ඔහුගේ එක් සහෝදරයෙකි. වසුබන්ධු යෝගාචාර්ය ඇළඳගත්තේ ඔහුගේ වැඩිමහල් සහෝදරයා අනුවය. යෝගාචාර්ය අනුව අසංග ක්‍රි. ව. 375 - 450 අතර වාසය කර ඇත.[4] අනෙකකි සෙන්වා දෙනුගේ අසංග 05 වෙනි සියවසෙහි විසූ බවයි.[5] ඔහුම ද එම අදහසට එකඟ වෙයි.[6] පරමාර්ථ විසින් රචනා කරන ලද වසුබන්ධු ජීවිත කථාවෙහි අසංග පිළිබඳව ද සඳහන් කරයි. නාගාර්ජුන පාදයන්ගේ නාමය ද තන්ත්‍රයානයේ ආරම්භකයා ලෙස සඳහන් කර ඇත.[7] එහෙත් දාර්ශනික නාගාර්ජුන නමින් පුද්ගලයින් කිහිප දෙනෙකු වාසය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඒ සම්බන්ධයෙන් ඉතිහාසගත සාක්ෂ්‍ය විරලය. තිත් ආදී බුදු දහමෙහි ද තාන්ත්‍රික බීජ දකී.[8] අභිචාර ක්‍රම නිරර්ථකවිද්‍යා ලෙස බුදුරජුන් ප්‍රතික්ෂේප කර ඇති බව ද අමතක නොකළ යුතුය.[9] එහෙත් සමහර තැනක ලෞකික අවශ්‍යතා සඳහා හිංසාකාරී නොවන පිරිත් සහ මන්ත්‍ර භාවිතය අනුදැන වදාරා තිබේ.[10]